දඹුල්ල ප්‍රාදේශීය සභාව

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මාර්ග කම්කරු (වැඩ ක්ෂේත්‍ර කම්කරු) තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුරු නාමය - මාර්ග කම්කරු (වැඩ ක්ෂේත්‍ර කම්කරු)

01.1.අධ්‍යාපන සුදුසුකම් -: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරක දී සමත් වී තිබිය යුතුය.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පමණක් ඉහත සුදුසුකම් 5 ශ්‍රේණිය සමත් වීම දක්වා අඩුකර බඳවා ගැනීමට ක්‍රියාකරනු ලැබේ.

02. බඳවා ගැනීමේ කොන්දේසි සහ පොදු සුදුසුකම් -:

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

iii. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර මධ්‍යම පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

iv. දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීමට වසමේ ග්‍රාම නිලධාරිගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඩුවම් ලැබූවෙකු නොවිය යුතු අතර රජයේ/ පළාත් රාජ්‍යය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

vii. මෙම බඳවා ගැනීම තාවකාලිකය. අදාළ තනතුර සඳහා වන ගෙවීම් සභාව විසින් අනුමත කරන ලද දෛනික වැටුපකට යටත් වේ.

viii. මෙම තාවකාලික පත්කිරීම දඹුල්ල ප්‍රාදේශීය සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය :

1. අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලුම දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

2. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරා ගෙන බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

04. අයදුම් කළ යුතු ආකාරය -:

- මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් සකස් කර, අයදුම්පත් 2026.04.20 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, දඹුල්ල ප්‍රාදේශීය සභාව, සීගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

- අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

  i. උප්පැන්න සහතිකය;
  ii. අධ්‍යාපන සහතික;
  iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්;
  iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්; (එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය);
  v. වෘත්තිය පිළිබඳ සහතික තිබේනම් එම සහතිකය;
  vi. සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.).

05. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල දඹුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.